# 8 වන දවස

## ඔබගේ ශ්‍රී නාමය සුවිශුද්ධ වේවා !

දෙවියන් වහන්සේ සුවිශුද්ධ වනසේක. එවිට දෙවියන් වහන්සේ කතා කොට, "**මෙතැනට ළං නොවන්න; නුඹේ පාදවලින් වහන් ගලවා දමන්න; නුඹ සිටින ස්ථානය ශුද්ධ භූමියකැ'යි වදාළ සේක**" (නික්මයාම 3:5) දෙවියන් වහන්සේ ශුද්ධ ය. ඔවුන් වහන්සේ වැඩ සිටින තැන ද ශුද්ධ ය. ගිවිසුම් කරඬුව මත දෙවියන් වහන්සේ වැඩ සිටින බව ඊශ්‍රායෙල් ජනයා විශ්වාස කළහ. එම කරඬුව පෙරහරින් රැගෙන යනවිට ඇල වූ නිසා උශ්ශා නැමති පුද්ගලයා ගිවිසුම් කරඬුවට අත දිගු කොට එය ඇල්ලුවේ ය. ඔහු ගිවිසුම් කරඬුව ළඟ මැරී වැටුණේ ය. මෙවැනි දේ නිසා දෙවියන් වහන්සේ ශුද්ධ ය, භයංකරය යන හැඟීම දේව ජනතාව අතර තදින් ම කාවැදී තිබුණි. දෙවියන් වහන්සේ සැබවින් ම ශුද්ධ ය. එළිදරව් 4:8 වන වගන්තියේ සඳහන් අයුරු "**සුර සේනාවෝ ............ සර්ව පරාක්‍රම දෙවියන් වහන්සේ සුවිශුද්ධය, සුවිශුද්ධය, සුවිශුද්ධයයි දිවා රෑ දෙක්හි නොනැවතී ගයන්නාහ.**" අපි දෙවියන් වහන්සේගේ ශුද්ධභාවය ඉදිරියේ වැඳ වැටෙමු. දෙවියන් වහන්සේ අපගේ ආදර තාත්තා බව ඇත්ත ය. එහෙත් ඔවුන් වහන්සේ ගැන සැහැල්ලුවෙන් නොසිතමු.

**දවස පුරා :-**

✵ අද දින පුරා ම අපි ද සුර සේනාවන් සමග මෙසේ ගයමු. ප්‍රශංසා කරමු. "**සුවිශුද්ධය! සුවිශුද්ධය! සුවිශුද්ධය! සුරසේනාවන්ගේ දෙවි සමිඳාණෝ සුවිශුද්ධය!**"

✵ පුබුදු ගීතාංජලී ගී අංක 267